**උතුරු පළාතේ ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (මහනුවර - යාපනය මාර්ගයේ කිලෝමීටර් 63 ක් පුනරුත්ථාපනය කිරීම) - 2014**

-----------------------------------------------------------------------------------------------------

උතුරු පළාතේ ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (මහනුවර - යාපනය මාර්ගයේ කිලෝමීටර් 63 ක් පුනරුත්ථාපනය කිරීම) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ චීන අපනයන - ආනයන බැංකුව අතර 2010 සැප්තැම්බර් 09 දින එළඹි අංක බීඑල්ඒ 201002 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහනුවර - යාපනය මාර්ගයේ (A 09) කිලෝමීටර් 122 කණුව සිට කිලෝමීටර් 230 කණුව දක්වා කිලෝමීටර් 63 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 83.5 ක් වූ අතර ඉන් එජඩො මිලියන 71 ක් මූල්‍යයනය කිරීමට චීන අපනයන - ආනයන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ මූලික වැඩ 2010 ජුනි 01 දින ආරම්භ කර තිබුණු අතර මාර්ගයේ පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වැඩ 2011 පෙබරවාරි 07 දින ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 ඔක්තෝබර් 06 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතියේ කටයුතු 2014 දෙසැම්බර් 31 දක්වා අඛණ්ඩව සිදු කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය

ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඖ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**--------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**----------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

සමාලෝචිත වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගත් රු.මිලියන 2.49 විශේෂ ණය මුදලක් වෙනම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. ණය බැරකම 2014 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පරිවයක් වශයෙන් කොන්ත්‍රාත්කරු සහ උපදේශක විසින් ප්‍රසම්පාදනය කරන ලද වාහන උපකරණ, ලී බඩු ආදී වත්කම්වල වටිනාකම වෙනම හඳුනාගෙන ව්‍යාපෘතියේ ගිණුම්වලට ගෙන නොතිබුණි. තවද ලබාගත හැකි වූ තොරතුරු අනුව, සිවිල් වැඩ වටිනාකමෙහි ඇතුළත් රු.මිලියන 35.92 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂය තුළ රේඛීය අමාත්‍යාංශයට මාරු කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු හා උපදේශක විසින් මිලදී ගන්නා ලද එම වත්කම් සහ රේඛීය අමාත්‍යාංශයට පසුව මාරු කරන ලද සිවිල් වැඩ වටිනාකමෙහි ඇතුළත් අනෙකුත් වත්කම්, ස්ථාවර වත්කම් ලේඛනයක් නොමැති වීම හා සත්‍යාපනය සඳහා අදාළ අනෙකුත් විස්තර නොමැති වීම හේතුවෙන් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය.

### 2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.මිලියන 1.367 ක්වූ පොදු කාර්ය පිරිවැය අයකර ගෙන තිබුණි. තවද එකී චක්‍රලේඛයේ 8.6 වගන්තිය ප්‍රකාර අනුමැතිය නොමැතිව, ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත කාර්ය මණ්ඩලයට රු.233,254 ක් වූ ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර දීමනා ගෙවා තිබුණි. ඉහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා මාගේ පෙර විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද, ඒ සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදීද එම පරිවයන් අඛණ්ඩව සිදු කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යායනය, අයවැයගත ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014 වර්ෂය තුළ** | | **2014 දෙසැම්බර් 31 දින දක්වා** | |
| | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) |
| චීන අපනයන - ආනයන බැංකුව | 71.00 | 8,153.20 | 5.70 | 746.05 | 70.98 | 8,568.61 |
| ශ්‍රී.ලං.ර. | 12.50 | 1,832.81 | 0.27 | 35.30 | 11.04 | 1,794.95 |
| | **83.50** | **9,986.01** | **5.97** | **781.35** | **82.02** | **10,363.56** |

## 3.2 භෞතික ප්‍රගතිය

-------------------

ලැබුණු තොරතුරු අනුව, මාර්ගයේ පුනරුත්ථාපන වැඩ අපේක්ෂිත දිනයට පෙර සම්පූර්ණයෙන් නිම කර තිබූ අතර, පුනරුත්ථාපන කරන ලද මාර්ග 2013 අගෝස්තු 06 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග වැඩවල දෝෂ වගකීම් කාලය 2014 අගෝස්තු 06 දිනට අවසන් වී තිබුණද 2015 අගෝස්තු මාසයේදී විගණකවරුන් විසින් කරන ලද වැඩ බිම් පරීක්ෂාවේදී මාර්ගයේ කිලෝමීටර් 131+100 සිට කිලෝමීටර් 131+106 දක්වා මාර්ග මතුපිට පිපිරීම් රාශියක් තිබූ බව අනාවරණය විය. තවද මාර්ගයේ බෝක්කු අංක 123/1 හි ශීර්ෂයේ හා වින්ග් වෝල්ස් (wing walls) හි සහ බෝක්කු අංක 132/1 හි කොන්ක්‍රීට් තට්ටුවේ පිපිරීම් නිරීක්ෂණය විය. ඊට අමතරව, පාලම් අංක 230/3 හි ප්‍රවේශ තට්ටුවේ අතුරු මුහුණත (interface) හා ඇස්පල්ට් කොන්ක්‍රීට් තට්ටුව අතර පිපිරීමක් නිරීක්ෂණය විය. දෝෂ වගකීම් කාලය තුළ කොන්ත්‍රාත්කරු මඟින් නිවැරදි කර ගැනීමට හැකිවන පරිදි එම දෝෂ අනාවරණය කර ගැනීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මාර්ගයේ කිලෝමීටර් 131+060 හි වම් පැත්තේ වංගුව විධිමත්ව සැලසුම් කර හා ප්‍රතිසංස්කරණය කර නොතිබූ බව වැඩ බිම් පරීක්ෂාවන්හි දී නිරීක්ෂණය විය. මාර්ගයේ කොටසක පළල මීටර් 0.5 කින් අඩුකර තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම ස්ථානයේ මාර්ගය මතුපිට හානි වී තිබුණි. තවද ආසන්නම ස්ථානයන්හි සංඥා පුවරු නොමැති වීම, මාර්ග අයින් රේඛා හා මැද රේඛා මැකී යාම හා මාර්ග වංගුවේ පටුබව හේතුවෙන් ආරක්ෂණ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) තාක්ෂණික පිරිවිතර වෙළුම 03 හි අංක 114 වගන්තිය ප්‍රකාරව, රියමඟ නඩත්තු කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වගකිව යුතු වන අතර අදාළ කාර්යයන් සඳහා ප්‍රමාණ පත්‍රවල රු.මිලියන 21.12 ක් වූ වෙන්කිරීමක් ද කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 73.95 ක මුදලක් වැයකර ඒ අනුව හිමිකම් ඉදිරිපත් කර ඇති බව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද නිම කිරීම් ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.